## ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම - 2016

-------------------------------------------------------------

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට විදේශීය නියෝජිතයන්ගෙන් ලැබිය යුතු රු.2,231,566 ක ශේෂය තුළ අන්තර්ගත 2014 හා 2015 වර්ෂවලට අදාළව එකතුව රු.612,657 ක් අයනොවී පැවතුණි.

(ආ) විදේශයන්හි දී මිය ගිය විගමණිකයන් වෙනුවෙන් රක්ෂණ සමාගම්වලින් 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සමාගමට ලැබී තිබු රු.4,750,687 ක මරණ වන්දි අදාළ පාර්ශවයන් වෙත ගෙවීමකින් හෝ වෙනත් සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමකින් තොරව දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඇ) ඒජන්සි සමාගම හරහා 2006 - 2007 කාලපරිච්ඡේදයේ දී කොරියාවට යවන ලද ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගෙන් ලබාගත් ආපසු ගෙවිය යුතු රු.16,610,000 ක ඇප තැන්පතු 2016 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.2,350,520 ක් වූ වෙනත් ණයහිමි ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,008,515 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.896,118 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,112,397 ක වර්ධනයක් ඇති වී තිබුණි. වෛද්‍ය මධ්‍යස්ථාන වියදම් රු.3,252,615 කින් හා වෙනත් පරිපාලන වියදම් රු.4,908,498 කින් වැඩි වුවද ආදායම රු. 11,113,093 කින් වැඩිවීම නිසා මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් ඇති වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

ශ්‍රී ලංකාව තුළ හෝ විදේශීය වශයෙන් වෘත්තීමය, පරිපාලනමය, තාක්ෂණිකමය කාර්මික පුහුණු, අර්ධ පුහුණු හෝ නුපුහුණු සියළුම වර්ගවලට අයත් සේවකයින් සඳහා රැකියා පිරිනැමීම හෝ සැපයීම සහ සේවක පුහුණු කිරීම් සිදු කිරීම සහ ව්‍යවස්ථාපිත නීති වලට අනුකූලව පවත්වාගෙන යාම සාංගමික ව්‍යවස්ථාවලිය අනුව සමාගමේ ප්‍රධාන අරමුණු වේ.

එම අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් ලබාගත් තොරතුරු අනුව පසුගිය වසර හතරක සමාගම හරහා විදේශගත කිරීම්, නියෝජිත රැකියා ආයතන හරහා විදේශගත කිරීම් සමග සැසඳීමේදී රාජ්‍ය ආයතනයක් ලෙස ඒජන්සිය ඒ සඳහා ලබා දී ඇති දායකත්වය ප්‍රමාණවත් නොවන බවත් විදේශ ශ්‍රමික වෙළඳපල කොටසින් සියයට 01 ට වඩා අඩු ප්‍රතිශතයක් සමාගම විසින් අත්පත් කරගෙන තිබුණු බවත් නිරීක්ෂණය විය.

(ආ) 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සමාගම මගින් විදේශගත වූ ශ්‍රමික සංඛ්‍යාවේ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කළ ද රැකියාවන් සඳහා යොමු කරන ලද රටවල් සංඛ්‍යාව ක්‍රමයෙන් 15 සිට 06 දක්වා අඩුවී තිබුණි.

(ඇ) 2016 වර්ෂයේ දී විගමණිකයන් 820 දෙනෙක් සමාගම මගින් රැකියාවන් සඳහා යොමු කර ඇතත් ඉන් 787 දෙනෙක් එනම් සියයට 96 ක් රටවල් 03 ක් සඳහා පමණක් විදේශගත කර තිබුණි. අනෙක් රටවල් වෙතින් රැකියා ඉල්ලුම හා අවස්ථා වර්ධනය කර ගැනීම කෙරෙහි සමාගම විසින් ප්‍රමාණවත් අවධානය යොමු කර ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

(ඈ) 2014, 2015 හා 2016 වර්ෂවලදී ඒජන්සිය විසින් විදේශරැකියා සඳහා ශ්‍රමිකයින් යොමු කිරීමේදී රැකියා වෙළෙඳපලේ රැකියා ක්ෂේත්‍ර වර්ග පිළිවෙලින් 78කට, 39කට හා 13කට යොමු වී තිබුණි. කෙසේ වුවද විදේශ රැකියා වෙළෙඳපලේ රැකියා ක්ෂේත්‍ර වර්ග 2430 ක් පමණ පැවතිය ද ඒජන්සිය විසින් රැකියා ක්ෂේත්‍ර වර්ග කිහිපයකට පමණක් සීමා වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) 2016 වර්ෂය තුල ඒජන්සිය වෙත රැකියා ඇණවුම් 22 ක් තුළින් රැකියා අවස්ථා 3,138 ක් ලැබී තිබුණ ද ඉන් විවිධ රැකියා සඳහා විදේශගත කිරීමට හැකි වී තිබුණේ විගමණිකයන් 820 දෙනෙකු පමණි. ඒ අනුව රැකියා අවස්ථා 2,318 ක් එනම් සියයට 74 ක් සඳහා ශ්‍රමිකයින් යැවීමට ඒජන්සිය අපොහොසත් වී තිබුණි.

ඒ අනුව විදේශ රැකියා වෙළඳපල සඳහා ශ්‍රමිකයින් යොමු කිරීමට විධිමත් සහ පැහැදිලි ක්‍රමවේදයක් ඒජන්සිය සතුව පවතින බවක් විගණනයේ දී නිරීක්ෂණය නොවුණි.

(ඊ) 2016 වර්ෂයේ දී විදේශගත වූ ශ්‍රමික සංඛ්‍යාව විදේශගත වූ රැකියා වර්ග සමඟ සසඳා බැලීමේ දී ගෘහස්ථ සේවක කම්කරු, කම්කරු හා කෘෂිකාර්මික සේවක යන නුපුහුණු අංශ කෙරෙහි ඒජන්සියේ වැඩි නැඹුරුවක් දක්නට තිබුණ ද පුහුණු සහ වෘත්තීය සුදුසුකම් සහිත පුද්ගලයින් දේශීය රැකියා වෙළඳපොලින් සොයා ගැනීමට ප්‍රමාණවත් ප්‍රවර්ධන වැඩපිළිවෙලක් ඒජන්සිය විසින් ක්‍රියාත්මක කර ඇති බවක් විගණනයට නිරීක්ෂණය නොවිණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------

### 5.1 අභ්‍යන්තර විගණනය

----------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව සමාගම සඳහා අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ණයගැති හා ණයහිමි පාලනය | ණයගැති ශේෂ අයකර ගැනීමට හා ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ආ) | ආදායම් ඉපයීම | ඒජන්සිය වෙත ලැබෙන රැකියා ඇණවුම් සඳහා උපරිම ශ්‍රමික දායකත්වයක් ලබාදීමට කටයුතු කිරීම තුලින් ආදායම ඉහළ නංවා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | මානව සම්පත් හා භෞතික සම්පත් පාලනය | මානව හා භෞතික සම්පත් ප්‍රශස්ථ ලෙස උපයෝජනය නොකිරීම. |